# සංක්ෂිප්තය

මෙම අධ්‍යයනය දියත් කිරීමේ ඉලක්කය වූයේ ජ්‍යෙෂ්ඨ ද්විතීක ශ්‍රේණිවල සිසුන් පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දි මුහුණ දෙන ගැටලු, නිරාකරණය සඳහා යොදා ගනු ලබන ක්‍රමශිල්ප පිළිබඳව අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය අරමුණු හතරක් ඔස්සේ සිදුවිය.

අධ්‍යයනයේ පළමු අරමුණ වූයේ ජ්‍යෙෂ්ඨ ද්විතීක ශ්‍රේණිවල සිසුන් ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලිය ආශ්‍රිතව මුහුණ දෙන ගැටලු හඳුනා ගැනිමයි. මෙහි දී පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බලපාන ක්ෂේත්‍ර හතරක් ඔස්සේ ගැටලු හඳුනා ගැනීම සිදු විය. එනම් විෂයමාලාවන් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු හඳුනා ගැනිම , ගුරුවරුන් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු හඳුනා ගැනීම , සමවයස් කණ්ඩායම් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු හඳුනා ගැනීම සහ පන්තිකාමර වාතාවරණය සම්බන්ධ ගැටලු හඳුනා ගැනීමයි. සිසුන්ට ලබා දෙන ලද ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් මෙම අරමුණට අදාළව කරුණු රැස්කිරීම සිදු විය.

අධ්‍යයනයේ දෙවන අරමුණ වූ සිසුන් මුහුණදෙන ගැටලු කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීමේ දී සිසු ප්‍රශ්නාවලි සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් තොරතුරු ලබා ගැනීම සිදු විය. මෙහි දි ද විෂයධාරාවන් , ගුරුවරුන් , සමවයස් කණ්ඩායම් හා පන්තිකාමර වාතාවරණය යන ක්ෂේත්‍ර ඔස්සේ දත්ත ලබා ගැනීම සිදු විය. තුන්වන අරමුණ වූයේ සිසුන් ගැටලු නිරාකරණය සඳහා යොදා ගනු ලබන ක්‍රියාමාර්ග විමසා බැලීමයි. මේ තුළින් සිසුන්ට ඒ ඒ ක්ෂේත්‍ර ඔස්සේ ගොඩනැගෙන ගැටලු නිරාකරණය සඳහා යොදාගනු ලබන නිරාකරණ ක්‍රමශිල්ප සහ ගැටලු නිරාකරණය පිළිබඳව පොදුවේ සිසුන් තුළ පවතින දැනුවත්භාවය හඳුනා ගැනීම සිදුවිය. එමෙන්ම ගැටලු නිරාකරණය සඳහා සිසුන් කවර පාර්ශවයන්ගෙන් සහයෝගය ලබාගන්නේ ද යන්න ද විමසා බැලීම සිදුවිය. අධ්‍යයනයේ හතරවන අරමුණ ඔස්සේ සිදු වූයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිසුන් මුහුණ දෙන ගැටලු පිළිබඳව ගුරු සංජානනයන් හඳුනා ගැනිමයි. ගුරුවරුන් සඳහා ලබා දුන් ප්‍රශ්නාවලී ඔස්සේ මේ සඳහා තොරතුරු ලබා ගැනීම සිදු විය.

පර්යේෂණය දියත් කිරීමේ දී අධ්‍යයනය සිදු කරනුයේ ප්‍රමාණාත්මක ක්‍රමවේදය යටතේ සමීක්ෂණ ක්‍රමයට අනුවය. දත්ත විශ්ලේෂණය සඳහා **SPSS** මගින් විචලතා විශ්ලේෂණය කිරීම සිදු විය. සිසු ගැටලු හා ගැටලු නිරාකරණ ක්‍රමශිල්ප ස්ත්‍රී පුරුෂභාවය හා හදාරන විෂයධාරාව අනුව වෙනස් වන්නේ ද යන්න විමසා බැලීම සිදු විය. ඒ ඒ අරමුණු ඔස්සේ ගොඩනගාගත් උප අරමුණු ඔස්සේ දත්ත විශ්ලේෂණය ක්‍රියාවලිය සිදුවිය.

පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය ඔස්සේ පෙනී යන්නේ සිසුන්ට පන්තිකාමර ඉගෙනුම් ඉගැන්විම් ක්‍රියාවලියේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බවය. ඒ අතරින් සිසුන් වැඩි ප්‍රතිශතයක් මුහුණ දෙන ගැටලු ලෙස විෂයමාලා සම්බන්ධ ගැටලු හඳුනා ගත හැකි

විය. විෂයමාලා සම්බන්ධ ගැටලු ඇතිවීම කෙරෙහි බලපාන සාධක ලෙස විෂයමාලාවේ සංකීර්ණබව මෙන් ම ගුරුවරුන් සම්බන්ධ සාධක ද බලපාන බව හදුනා ගත හැකි විය. ගුරු සංජානන අනුව ගත් කල ද අනාවරණය වූයේ පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආශ්‍රිතව සිසුන්ට විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බව ය.

අධ්‍යයනය තුළින් හදුනාගත් නිගමනයන් තුළින් යෝජනා ඉදිරිපත් කිරීම සිදුවිය. සිසු ගැටලු හදුනාගෙන එම ගැටලු කිරාකරණය කර ගැනීමට ගැටලු නිරාකරණය පිළිබඳ දැනුවත්භාවයක් ලබා දීම වැදගත් වන බව යෝජනා කරන ලදි. එමෙන් ම ගැටලු නිරාකරණයට සිසුන්ට දැනුවත් මැදිහත්වීමක් ලබා දීම පිළිබඳවද අධ්‍යයනය තුළින් යෝජනා කිරීම සිදු විය.